


# ඊශ්‍රායලය එක්රැස් කරන්නට සහෝදරියන්ගේ දායකත්වය

සභාපති රසල් එම්. නෙල්සන් විසින්

සභාවේ සහෝදරියනි, මම ඔබට දිවැසිවර ආයාචනයක් ඉදිරිපත් කර සිටිනවා, විසිරී සිටින ඊශ්‍රායලය එක් කර අනාගතය හැඩගැස්වීමට උදව් කරන ලෙස.



මගේ දයාබර සහ වටිනා සහෝදරියනි, ඔබ හා සමග සිටීමට හැකිවීම හරිම අපූරුයි. ඒ කොහොම වුනත් ඔබ පිළිබඳව සහ ඔබට ඇති උත්තරීතර හැකියාවන් පිළිබඳව මට සිතෙන ආකාරය මෑත කාලීන අත්දැකීමක් තුලින් ඔබට ඉඟියක් දේවි.

දකුණු ආමරිකාවේ, දවසක් මම සභාවකට කතා කරමින් සිටියා, මගේ මාතෘකාව ගැන මම ගොඩාක් උද්දාමයට පත්වුනා, ප්‍රධානම අවස්ථාවකදී මම මෙහෙම කිව්වා, "දරුවන් 10 දෙනෙකුගේ මවක් ලෙස, මට එය ඔබට එය කියන්න පුළුවන්..." එහෙම කියලා මම මගේ පණිවිඩය බෙදාගැනීම සම්පූර්ණ කළා.

මවක් කියන වචනය කිව්වා කියලා මට තේරුනේ නෑ. මගේ පරිවර්තකයා, මම එය වැරදියට කිව්වා කියලා හිතාගෙන, මවක් කියන වචනේ පියෙක් කියලා වෙනස් කළා, ඉතින් ඒ සභාව කවදාවත් දැනගත්තේ නෑ මම මාව මවක් ලෙස හඳුන්වපු බවට. නමුත් මගේ බිරිඳ වෙන්ඩිට ඒක ඇහුනා, ඇය මගේ ලිස්සා යාම ගැන සතුටු උනා.

ඒ අවස්ථාවේදී, මවක් කරනවා මෙන් - ලෝකයේ වෙනසක් කරන්නට මගේ හදවතේ ගැඹුරින්ම නැගුනු උවමනාව - මගේ හදවතේ ඉස්මතු උනා. අවුරුදු ගණනාවක් පුරාවටම, මම වෛද්‍යවරයෙකු වීමට තෝරාගත්තේ ඇයි කියලා මගෙන් අහපු ප්‍රශ්ණයට, මගේ පිළිතුර හැමදාමත් එක වගෙයි: "මොකද මට මවක් වෙන්න තෝරාගන්න පුළුවන්කමක් නැහැ."

මව, කියන වචනය මම භාවිතා කරද්දී, කරුණාකරලා මතක තියාගන්න මම කතා කරන්නේ දරුවෙකුට උපත ලබාදුන් හෝ දරුවෙකු අරන් හදාගත් කාන්තාවන් ගැන විතරක් නෙවෙයි මම කතා කරන්නේ. මම කතා කරන්නේ ස්වර්ගීය පියාණන්ගේ සියලුම වැඩිමහල් දියණියන් ගැන. සෑම කාන්තාවක්ම ඇයගේ සදාකාලික දිව්‍යමය දෛවයෙන්ම යහපත් මවක්.

ඉතින් අද රාත්‍රියේදී, දරුවන් 10 දෙනෙකුගේ —දියණියන් නවයක් සහ එක පුතෙකුගේ පියා වශයෙන් - සහ සභාවේ සභාපති වශයෙන්, මට ඔබ ගැන - ඔබ කව්ද සහ ඔබ කළ හැකි සියලුම යහපත් දේ ගැන කෙතරම් ගැඹුරින් දැනෙනවාද කියලා ඔබට දැනේවා කියා මම යාච්ඤා කරනවා. ධර්මිෂ්ට කාන්තාවකට කල හැකිදේ කිසිවෙකුටත් කරන්නට බැහැ. මවකගේ ආනුභාවය කිසිවෙකුටත් වෙනම දෙන්නට බැහැ.

පිරිමින්ට හැමවිටම ස්වර්ගික පියාණන්ගේ සහ ගැලවුම්කරුවාණන්ගේ ප්‍රේමය අනෙක් අයට සන්නිවේදනය කරන්න පුළුවන්. නමුත් කාන්තාවන්ට ඒ සඳහා තියනවා විශේෂ දීමනාවක් - ඒක දිව්‍යමය උරුමයක්. ඔබට තියෙනවා කෙනෙකුගේ අවශ්‍යතාවයන් - සහ ඔහුට හෝ ඇයට ඒ අවශ්‍ය මොහොත දැනෙන හැකියාවක්. ඔබට පුළුවන් කෙනෙකුට

ඔහුගේ හෝ ඇයගේ අවශ්‍යම මොහොතේ ලඟාවෙන්න, සනසවන්න, උගන්වන්න, සහ ශක්තිමත් කරන්න.

කාන්තාවන් පිරිමින්ට වඩා වෙනස් ලෙස දේවල් දකිනවා, සහ අපිට ඔබේ දෘෂ්ටිකෝණය කෙතරම් නම් අවශ්‍යද! ඔබේ ස්වභාවය පළමුව, අනෙක් අය ගැන සිතන්නට, ඕනෑම ක්‍රියාවකින් අනෙක් අය කෙරෙහි ඇතිවන බලපෑම ගැන සලකා බලන්නට ඔබව පොළඹවනවා.

සභාපති අයිරින් ප්‍රකාශ කල පරිදි, “වැටීම” කියලා අපි හඳුන්වන - ස්වර්ගික පියාණන්ගේ සැලැස්ම අයගේ දුර දක්නා නුවණින් දැක ක්‍රියාකිරීම අපේ උතුම් ඒවා වූ මවගේ හැකියාවයි. ඇයගේ නුවණක්කාර තෝරාගැනීම සහ ආදම්ගේ උපකාරී තීරණය දෙවියන්වහන්සේගේ ප්‍රීතියේ සැලැස්ම ඉදිරියටම ගෙනගියා. අපි හැම කෙනෙක්ටම මේ ලෝකයට එන්නට, ශරීරයක් ලබාගන්නට, සහ අප පෙර ලෝකයේදී කලාක් මෙන්ම, දැන්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමග නැගී සිටීමට තෝරාගත් බව ඔප්පු කරන්නට ඔවුන් අපට පුළුවන්කම ලබාදුන්නා.

මගේ දයාබර සහෝදරියනි, ඔබට තියනවා විශේෂ ආත්මික ත්‍යාග සහ ප්‍රවණතාවන්. මේ රාත්‍රියේදී මම ඔබෙන් අයදිනවා, මගේ හදවතේ මුළු බලාපොරොත්තුවෙන්ම, ඔබේ ආත්මීය ත්‍යාග තේරුම් ගැනීමට - පෝෂණය කරගැනීමට, භාවිතා කිරීමට සහ ඔබට කෙදිනකවත් නොතිබූ තරම් ඒවා ව්‍යාප්ත කරගැනීමට ඔබට හැකිවේවායි මම යාච්ඤා කරනවා. එසේ කරන විට ඔබ ලෝකය වෙනස් කරයි.

කාන්තාවන් ලෙස, ඔබ අන් අය ප්‍රබෝධමත් කරන අතරම අනුකරණය කරන්නට හැකි තරමේ තත්වයන් ඇති කරනවා. අපගේ පසුගිය ප්‍රධාන සම්මන්ත්‍රණයේ ප්‍රකාශ කල විශාල වැදගත් ප්‍රකාශන දෙකක් පිලිබඳ වටපිටාව ගැන බිඳක් මම ඔබට කියන්නම්. ඔබ, මගේ දයාබර සහෝදරියනි, ඒ හැම එකකටම යතුරයි.

පළමුව, දේවසේවය. දෙවසේවයේ අති උතුම්ම උදාහරණය අපගේ ගැලවුම්කරු යේසුස් ක්‍රිස්තුස්වහන්සේයි. සාමාන්‍යයෙන්, පිරිමින්ට වඩා කාන්තාවන් ඒ උදාහරණයට හැමදාමත් ආසන්නව සිටියා. ඔබ සත්‍ය ලෙසම දේවසේවය කරන විට, තවත් කෙනෙකුට ගැලවුම්කරුවාණන්ගේ ප්‍රේමය අත්විඳීමට උදව් වීමට ඔබ ඔබගේ සිතුවිලි අනුගමනය කරනවා. දේවසේවය කිරීමට කැමැත්ත ධර්මිෂ්ට කාන්තාවන්ට උරුමයි. “කාට උදව් කරන්නට ඔබවහන්සේ මාව පොළඹවන්නේ ද?” ලෙස යාච්ඤා කරන කාන්තාවන්ව මම දන්නවා.

අන් අය ගැන සලකා බැලීමේ උතුම් සහ ශුද්ධවූ ක්‍රමය ගැන 2018 අප්‍රියෙල් නිවේදනයට පෙර, සමහර පිරිමින්ගේ කැමැත්ත වුයේ ඔවුන්ගේ නිවාස බහදැකීමේ පැවරුම ඉදිරියෙන් හරි ලකුණ දමා අනෙක් ක්‍රියාකාරකමට යාමයි.

නමුත් ඔබ බැහැදැක උගන්වන සහෝදරියකට උපකාරයක් අවශ්‍ය විට, ඔබ එවෙලේම සහ මාසය පුරාවටත් ක්‍රියාකලා. ඒ නිසා, දේවසේවය සඳහා මාරුවීමට අපට ඉගැන්වුයේ ඔබ බැහැදැකීම් කල ආකාරයයි.

දෙවනුව, පසුගිය ප්‍රධාන සම්මන්ත්‍රණයේදී, අපි මෙල්කිසදෙක් ගණපූර්ණ නැවත ප්‍රතිව්‍යුහගත කළා. සභාවේ පිරිමින්ට ඔවුන්ගේ වගකීම් වලදී ඵලදායී වන්නට උදව් කිරීම ගැන අපි පොරබදින අවස්ථාවේදී, අපි ඉතා සීරුවෙන් සහන සමිතියේ උදාහරණය පිලිබඳ සැලකිලිමත් උනා.

සහන සමිතියේදී, එක් එක් වයස් මට්ටම් සහ තත්ත්ව වල කාන්තාවන් එකට මුණගැහෙනවා ජීවිතයේ එක් එක් දශක අනන්‍ය වූ අභියෝග ගෙනෙනවා, සහ නමුත්, ඔබ, සතියෙන් සතියට, එකට එකතුව, වර්ධනය වී සහ සුභාරංචිය එකට එකතුවී උගන්වා, ලෝකයේ සත්‍ය වූ වෙනසක් ඇති කරනවා.

දැන්, ඔබේ උදාහරණයෙන් පසු, මෙල්කිසදෙක් පූජකවරය දරන්නන් වැඩිහිටි ගනපූර්ණයේ සාමාජිකයන්. මේ පිරිමින් වයස අවු 18 සිට 98 (සමහර විට වැඩි), එක පූජකවරයක් සහ සභා අත්දැකීම් සමානව දරන අය. මේ සහෝදරයන්ට දැන් පුළුවන් ශක්තිමත් සහෝදර බැඳීමක් ඇතිකරගෙන, අන් අයට පලදායී ලෙස ආශිර්වාද කරන්නට.

ඔබට මතකද පසුගිය ජුනි මාසයේ, සභාවේ තරුණ පිරිසට මමත් නෙල්සන් සහෝදරියත් කතා කළා. තිරය දෙපසම සිටින ඊශ්‍රායලය එකතු කරන්නට ස්වාමින්වහන්සේගේ තරුණ සේනාවට එකතු වන ලෙස අපි ඔවුන්ට ආරාධනා කළා. මේ එක කිරීම තමයි “ශ්‍රේෂ්ටතම අභියෝගය, ශ්‍රේෂ්ටතම කාරණය, සහ මේ පොලව තුල ශ්‍රේෂ්ටතම ක්‍රියාව.”![1]

එය කාන්තාවන් අනිවාර්යෙන්ම අවශ්‍ය කාරණයක්, මොකද කාන්තාවන් අනාගතය සකසනවා. ඉතින් මේ රාත්‍රියේදී මම සභාවේ කාන්තාවන් වන ඔබට දිවැසිවර ආයාචනයක් ඉදිරිපත් කරනවා, ඊශ්‍රායලය එකතු කරන්නට උදව් වෙමින් අනාගතය සකසන්නට සහය වන ලෙස.

ඔබට පටන් ගත හැක්කේ කොහෙන්ද?

මම ඔබට ආරාධනයන් හතරක් ඉදිරිපත් කරනවා:

පළමුව, ඔබට සෘණාත්මක සහ අපවිත්‍ර සිතුවිලි ඔබේ මනසට ගෙනෙන මාධ්‍ය සහ සමාජ ජාලා වලින් දින 10 ක් බැහැරව උපවාසයක සිටීමකට සහභාගී වන ලෙස මම ඔබට ආරාධනා කර සිටිනවා. ඔබගේ උපවාසයේදී ඔබ බැහැර කල යුතු දේ දැනගැනීමට යාච්ඤා කරන්න. ඔබගේ දින 10- උපවාසය ඔබව පුදුම කරාවි. ඔබගේ ආත්මය තුවාල කරන ලෝකයේ දේවල් වලින් නිවාඩුවක් ගත්විට ඔබ දැක්කේ කුමක්ද? ඔබට දැන් ඔබේ කාලය සහ බලය පාවිච්චි කිරීමට ඇති උවමනාව ගැන යම් වෙනසක් තියනවාද? ඔබගේ ප්‍රමුඛතා කුඩා ප්‍රමාණයකින් හෝ වෙනස් වී තියනවාද? ඔබට දැනෙන එක් එක් හැඟීම සටහන් කර තබා ගන්නා ලෙස මම ඔබගෙන් ඉල්ලා සිටිනවා.

දෙවනුව, දැන් සහ මේ වර්ෂයේ අවසානය අතරතුර මෝර්මන් පොත කියවන ලෙස මම ඔබව දිරිගන්වනවා. ඔබේ ජීවිතයේ පරිපාලනය කරගන්නට ඔබ වෙර දරන හැමදේ අතරින් එය කල නොහැකි බව සිතුනත්, ඔබගේ මුළු හදවතින්ම මෙම ආරාධනය පිළිගත්තොත්, එය කරන්නට ස්වාමින්වහන්සේ ඔබට මාර්ගයකට උපකාර කරාවි. සහ, ඔබ යාච්ඤාශිලීව අධ්‍යනය කරන විට, මම පොරොන්දු වෙනවා ස්වර්ගය ඔබ වෙත විවෘත වේවි. මහත් ආනුභාවයකින් සහ අනාවැකි සමග ස්වාමින්වහන්සේ ඔබට ආශිර්වාද කරනු ඇත.

ඔබ කියවන විට, ගැලවුම්කරුවාණන් ගැන හෝ පිලිබඳ ඇති සෑම වැකියක්ම සලකුණු කරන ලෙස මම ඔබව දිරිගන්වනවා. ඊටපසු, ක්‍රිස්තුස්වහන්සේ ගැන කතාකරන්නට, ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රශංසා කරන්නට සහ ඔබගේ පවුල සහ මිතුරන් සමග ක්‍රිස්තුස්වහන්සේ ගැන දේශනා කරන්නට චේතනාවක් ඇති කරගන්න.[2] මේ ක්‍රියාවලිය තුල ඔබත් ඔවුනුත් ගැලවුම්කරුවාණන් දෙසට තවත් ලං වේවි. වෙනස්කම්, සහ ප්‍රාතිහාර්ය සිදුවෙන්නට පටන් ගනීවි.

අද උදෑසන නව ඉරිදා කාලසටහන සහ ගෘහාශ්‍රිත, සභා උපකාරී ක්‍රියාපටිපාටියක් පිලිබඳ නිවේදනයක් නිකුත් කළා. ඔබ, මගේ දයාබර සහෝදරියනි, මෙම අළුත්, සමබර, සහ සැලසුම් කල සුභාරංචි - ඉගැන්වීම් ප්‍රයත්නයේ සාර්ථකත්වයට යතුරු ඔබලායි. ඔබ ශුද්ධ ලියවිලි වලින් ඉගෙන ගන්නා දේ ඔබ ආදරය කරන්නන්ට උගන්වන්න. ඔවුන් පව් කිරීමේදී ගැලවුම්කරුවාණන්ගේ සුවකිරීමේ සහ පිරිසිදු කිරීමේ බලය දෙසට හැරෙන ආකාරය ඔවුන්ට උගන්වන්න. සහ ඔවුන්ගේ ජීවිතයේ සෑම දිනකදීම උන්වහන්සේගේ ශක්තිමත් කිරීමේ බලය දෙසට ලංවෙන ආකාරය ඔවුන්ට උගන්වන්න.

තුන්වනුව, දේවමාලිගාවට නිතර සහභාගී වීමේ ක්‍රමයක් සාදාගන්න. මේ සඳහා ඔබේ ජීවිතයෙන් තව යම් වැඩි පරිත්‍යාගයක් අවශ්‍ය වේවි. උන්වහන්සේගේ දේවමාලිගාවේදී ඔබට ලැබී ඇති උන්වහන්සේගේ පූජකත්ව බලයට ලඟා වෙන්නට ඔබ වැඩියෙන් දේවමාලිගාවට සහභාගී වීමේදී උන්වහන්සේ ඔබට උගන්වයි. දේවමාලිගාවක් ආසන්නයේ ජීවත් නොවන අය, මම ඔබට ආරාධනා කරනවා ශුද්ධ ලියවිලි වල සහ ජීවමාන දිවසිවරුන්ගේ වචන වලින් දේවමාලිගා ගැන යාච්ඤාශිලිව අධ්‍යනය කරන ලෙස. ඔබ කෙදිනවත් නැති තරම් දේවමාලිගා ගැන දැනගන්නට, තේරුම්ගන්නට, සහ දැනෙන්නට සොයන්න.

පසුගිය ජූනි, අපගේ ලොව පුරා තරුණ සම්මන්ත්‍රණයේදී, මම කතා කළා එක තරුණයෙක් ගැන ඔහුගේ දෙමව්පියන් ඔහුගේ ස්මාර්ට් ජංගම දුරකථනය සාමාන්‍ය ජංගම දුරකතනයක් සමග මාරු කලවිට ඔහුගේ ජීවිතය වෙනස් වී තිබුනා. මේ තරුණයාගේ මව ඇදහිල්ලේ බිය නැති කාන්තාවක්. ධර්මදූත සේවයකින් ඔහුව ඈතට අදින තෝරාගැනීම් ඇය තම පුතාගෙන් දුටුවා. ඇයගේ පුතාට උදව් කරන්නේ කෙසේද යන්න දැනගැනීම පිණිස යදින්නට ඇය දේවමාලිගාවට ගියා. ඉන්පසු ඇයට ලැබුණු සෑම පෙළඹවීමකටම ඇය ක්‍රියාකලා.

ඇය මෙහෙම කිව්වා: “මට ආත්මයාණන් විසින් පෙළඹවීමක් ලැබුනා නිශ්චිත වේලාවන්වල නිශ්චිත දේවල් මගේ පුතාගේ දුරකථනය තුල පරික්ෂා කරන්න. මම දන්නේ නෑ මේ ස්මාර්ට් දුරකථන හසුරවන්නේ කොහොමද කියලා, නමුත් ශුද්ධාත්මයාණන් මම කවදාවත් පාවිච්චි කරලා නැති සමාජ ජාලා ඔස්සේ මාව මෙහෙයවූවා! මම දන්නවා තමන්ගේ දරුවන් ආරක්ෂා කරන්න මගපෙන්වීම හොයන දෙමව්පියන්ට ශුද්ධාත්මයාණන් උදව් කරනවා කියලා . [මුලින්ම] මගේ පුතා මාත් එක්ක තරහ ගිහින් හිටියේ. ... නමුත් දවස් තුනකට පස්සේ, ඔහු මට ස්තුති කළා! ඔහුට ඒ වෙනස දැනුනා.”

ඇයගේ පුතාගේ හැසිරීම සහ විලාසය බොහෝ ලෙස වෙනස් වුණා. ඔහු ගෙදරට වඩා උපකාරී උනා, වැඩියෙන් සිනාසුනා සහ සභාවට වැඩියෙන් ලංවුනා. වෙලාවක දේවමාලිගාවේ බෞතිස්ම කරන්නෙක් ලෙස සේවය කිරීමට ඔහු ප්‍රිය කළා සහ දැන් ඔහු ධර්මදූත සේවය සඳහා සූදානම් වෙනවා.

මගේ හතරවෙනි ආරාධනය, වයස හරි හැමකෙනෙක්ම සහන සමිතියට සම්පූර්ණ ලෙස සහභාගී වන්න. සහන සමිති අරමුණු ගැන ප්‍රකාශය අධ්‍යනය කරන ලෙස මම ඔබෙන් ඉල්ලා සිටිනවා. එය හරිම දිරිගන්වන සුළුයි. ඔබගේ ජීවිතයේ අරමුණ සහිත ප්‍රකාශයක් ගොඩනගාගන්නට එය ඔබට උපකාරී වන්නටත් පුළුවන්. අවුරුදු 20 කට පමණ පෙර සහන සමිති ප්‍රකාශනයේ සත්‍ය අත්විදින ලෙස බැගෑපත් ලෙස ඉල්ලා සිටිනවා.[3] එම ප්‍රකාශනයේ රාමු කල පිටපතක් පළමු සභාපතිත්ව කාර්යාලයේ බිත්තියක එල්ලා තියෙනවා. එය කියවන හැම වෙලාවෙම මම ප්‍රීති වෙනවා. ඊශ්‍රායලය රැස් කරන්නට ඔබ ඔබගේ කොටස කරමින් සහය වන මේ හරි වෙලාවේ ඔබ කව්ද සහ ස්වාමින්වහන්සේ කැමති ඔබ කෙසේ වනවාටද යැයි එය පැහැදිලි කරනවා.

මගේ දයාබර සොහොයුරියනි, අපිට ඔබ අවශ්‍යයි! අපිට අවශ්‍යයි ඔබේ ශක්තිය, ඔබේ හැරීම, ඔබේ අවබෝධය, පෙරමුණ ගැනීමට ඇති ඔබේ හැකියාව, ඔබගේ ඥානය, සහ ඔබගේ හඬ.”[4] සරලවම අපිට ඔබ නැතිව ඊශ්‍රායලය එක කරන්නට නොහැකියි.

මම ඔබලාට ආදරෙයි සහ ස්තුතිවන්ත වෙනවා සහ දැන් මම ඔබලාට ආශිර්වාද කරනවා මෙම අමාරු එමෙන්ම අත්‍යවශ්‍ය කාර්යයේදී ලෝකය පසෙක තබන්නට හැකිවන ලෙස. උන්වහන්සේගේ ආදරණීය පුත්‍රයාණන්ගේ දෙවැනි පැමිණීමට මේ ලෝකය සූදානම් කරන්නට ස්වර්ගික පියාණන් අපෙන් බලාපොරොත්තු වන සියල්ල අපිට එක්ව කල හැකියි.

යේසුස් නම් ක්‍රිස්තුස්වහන්සේයි. මේ උන්වහන්සේගේ සභාවයි. මම මේ හැමදෙයක්ම සාක්ෂි දරන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ආමෙන්.

සටහන්

1. Russell M. Nelson, “Hope of Israel” (worldwide youth devotional, June 3, 2018), HopeofIsrael.lds.org.

2. බලන්න නෙපි 25:26.


3. For the Relief Society declaration, see Mary Ellen Smoot, “Rejoice, Daughters of Zion,” *Liahona,* Jan. 2000, 111–14.

4. Russell M. Nelson, “A Plea to My Sisters,” *Liahona,* Nov. 2015, 96; emphasis added.

# සභාවේ නිවැරදි නම

සභාපති රසල් එම්. නෙල්සන් විසින්

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, උන්වහන්සෙගේ සභාව උන්වහන්සෙගේ නමින් හඳුන්වන ලෙස අප මෙහෙයවනවා, මන්ද ඒ උන්වහන්සේගේ බලයෙන් පිරි උන්වහන්සේගේ සභාවයි.



මගේ ආදරණීය සහෝදර සහෝදරියනි, මේ සුන්දර සබත් දවසේ ස්වාමින්වහන්සේ අපට දුන්නාවූ සියලුම ආශිර්වාද වෙනුවෙන් අපි එක්ව සතුටු වෙනවා. නැවත පිහිටවනු ලැබූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව පිළිබඳව ඔබට ඇති සාක්ෂිය වෙනුවෙන්, උන්වහන්සේගේ ගිවිසුම්ගත මාර්ගයට නැවත පැමිණෙන්ටත් එහි රැඳී සිටීමටත් ඔබ කරන සියලුම කැපවීම් වෙනුවෙන්, සහ උන්වහන්සේගේ සභාව තුල ඔබ කරනු ලබන අභිශේකලත් සේවය වෙනුවෙනුත් අපි ස්තුතිවන්ත වෙනවා.

අද දවසේ ඔබ සමඟ වැදගත් දෙයක් පිළිබඳව කතාකිරීමට මාව පොළඹවනවා වැනි හැඟීමක් දැනෙනවා. සති කිහිපයකට පෙර, මා විසින් සභාවේ නම භාවිතා කරන ආකාරයේ නිවැරදි කිරීමක් සම්බන්ධයෙන් ප්‍රකාශයක් නිකුත් කළා.[1] මම එසේ කලේ උන්වහන්සේගේ සභාව වෙනුවෙන් උන්වහන්සේ නියම කල නාමය වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසුදවස්වල ශුද්ධවන්තයිනගෙන් යුත් සභාව යන්නෙහි ඇති වැදගත්කම උන්වහන්සේ විසින් මගේ සිතට කාවැද්දූ නිසයි.[2]

ඔබ අපේක්ෂා කරන පරිදි, මෙම ප්‍රකාශයට සහ සංශෝධිත ශෛලිය [3] සඳහා බොහෝ ධනාත්මක සහ සෘණාත්මක පිළිතුරු ලැබී තිබෙනවා. බොහෝ සාමාජිකයන් එසැනින්ම ඔවුන්ගේ බ්ලොග් වල සහ සමාජ මාධ්‍යන් වල සභාවේ නම වෙනස්කර ගත්තා. සමහර අය කල්පනා කළා ඇයි, ලෝකයේ මෙතරම් දේවල් වනකොට, මෙවැනි "වැදගත්කමක් නැති" දෙයක් ගැන අවධාරණය කිරීම අවශ්‍යද කියලා. සමහර අය කිවුවා, ඒක කරන්න බැරි දෙයක්, ඉතින් මොකටද උත්සහ කරන්නේ? කියලා. මෙම කාරණය පිළිබඳව අපි මෙතරම් සැලකිලිමත් වෙන්නේ ඇයි කියලා මම පැහැදිලි කරන්නම්. නමුත් මුලින්ම මම සඳහන් කරන්නම් මෙයින් අපි උත්සහ නොකරන්නේ මොනවාද කියලා:

- එය නම වෙනස් කිරීමක් නොවේ.
- එය වෙළඳ නාමකරණයක් වැනි නැවත නම් කිරීමක් නොවේ
- එය භාහිර අලංකරණයක් නොවේ.
- එය හදිසියේ ඇතිවූ කල්පනාවක් නොවේ.
- එය වැදගත්කමකට නැති දෙයක් නොවේ.

ඒ වෙනුවට, එය නිවැරදි කිරීමක්. එය ස්වාමින්වහන්සේගේ අණක්. ජෝසෆ් ස්මිත් ඔහු තුලින් පිහිටවපු සභාව නම් කලේ නෑ; ඒ වගෙමයි මෝර්මන්. ගැලවුම්කාරයාණන් උන්වහන්සේ විසින්ම පැවසුවා, " පසු-දවස්වලදී මගේ සභාව අමතනු ලබන්නේ "යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයින්ගෙන් යුත් සභාව ලෙසයි." යනුවෙන්. [4]

මීට පෙරදීත්, ක්‍රි.පූ. 34 දී, අපගේ උත්තානවූ ස්වාමින්වහන්සේ මේ හා සමානම උපදෙසක් සභාවේ සාමාජිකයන්ට බැහැදැකීමට පුරාන ඇමරිකාවට පැමිණි විට කිවුවා. ඒ වේලාවෙදී උන්වහන්සේ කිවුවා:

"නුඹලා සභාව මාගේ නාමයෙන් නම් කරන්නහුය. …

"තවද එය මාගේ නාමයෙන් නම් කරන්නේ නම් මිස, එය මාගේ සභාව වන්නේ කෙසේද? මන්ද මෝසෙස්ගේ නාමයෙන් සභාවක් නම් කරන්නේ නම් එවිට එය මෝසෙස්ගේ සභාව වන්නේය; නැතහොත් එය මනුශ්‍යකුගේ නාමයෙන් නම් කරන්නේද එවිට එය මනුශ්‍යකුගේ සභාවක් වන්නේය; එහෙත් එය මගේ නාමයෙන් නම් කරන්නේද එවිට එය මාගේ සභාව වන්නේය."[5]

මේ අනුව, සභාවේ නම වෙනස්කල නොහැකියි. ගැලවුම්කාරයාණන් පැහැදිලිවම පවසනවා නම් උන්වහන්සේගේ සභාව නම කුමක් විය යුතුද කියලා, ඒ වගේම උන්වහන්සේ "මාගේ සභාව ආමන්ත්‍රණය කලයුත්තේ මෙලෙසයි," වැනි ප්‍රකාශ කරනවා නම්, එයින් අදහස් වන්නේ එය බොහෝම බැරුරුම් යන්නයි. එනිසා අපි කෙටි නම් භාවිතා කිරීමට ඉඩ දෙනවානම්, හෝ අපි විසින්ම එම නම් වලට අනුබල දෙනවානම්, එයින් උන්වහන්සේගේ සිත රිදෙනවා.

නමක ඇත්තේ කුමක්ද නැතිනම් මෙහිදී, කෙටි නමක ඇත්තේ කුමක්ද? සභාවේ කෙටි නමක් පිළිබඳව සඳහන් කරනවානම්, "එල්.ඩී.එස්. සභාව, "මෝර්මන් සභාව," හෝ "පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ සභාව" වැනි, මෙහිදී එම නම් වල වැදගත්ම මහහැරීම වන්නේ ගැලවුම්කාරයාණන්වහන්සේගේ නාමය නොමැති වීමයි. ස්වාමින්වහන්සේගේ නාමය ස්වාමින්වහන්සේගේ සභාවෙන් ඉවත් කිරීම සාතන් ලබන විශාල ජයක්. අපි ගැලවුම්කාරයාණන්ගේ නාමය බැහැර කරනවා නම්, අපි යේසුස්වහන්සේ අපට කල සෑම දෙයක්ම - උන්වහන්සේගේ වන්දිගෙවීම පවා ඉතා පහසුවෙන් නොසලකා හරිනවා.

උන්වහන්සේ බලන ආකාරයට මේ ගැන සිතන්න, මනුෂ්‍ය ජීවිතයට පෙර ජීවිතයේදී, යෙහෝවා, පරණ ගිවිසුමේ දෙවියන්වහන්සේ උන්වහන්සේයි. උන්වහන්සේගේ පියාණන්ගේ මඟපෙන්වීම ඇතිව, මෙම ලෝකයේ සහ අනිකුත් සියලුම ලෝකවල මැවුම්කාරයාණන් උන්වහන්සේයි.[6] උන්වහන්සේ උන්වහන්සේගේ පියාණන්ගේ කැමැත්තට

යටත්වී වෙන කිසිම කෙනෙකුට කල නොහැකි දෙයක් දෙවියන්වහන්සේගේ සියලුම දරුවන් වෙනුවෙන් කිරීමට තෝරාගත්තා! පියාණන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයා ලෙස මාංශයෙන් මේ ලෝකයට ඒමට නිහතමානී වූ, උන්වහන්සේව අමානුෂික ලෙස නින්දා කර, අපහාස කර, කෙලගසා, සහ කස පහර දුන්නා. ගෙත්සෙමනි උයනේදී, අපගේ ගැලවුම්කාරයාණන්වහන්සේ ඔබ සහ මම, සහ මේතාක් ජීවත් වූ සහ ජීවත්වන සෑම කෙනෙකුම අත්දුටු සෑම වේදනාවක්ම, සෑම පාපයක්ම, සහ සියලුම දුකක් සහ වේදනාවක්ම උන්වහන්සේ මතට ගත්තා. එම අතිවිශාල වේදනාත්මක බරත් සමඟම, ඔහුගේ සෑම රෝම කූපයකින්ම ලේ ගැලුවා.[7] උන්වහන්සේව කෲර ලෙස කල්වාරියේ කුරුසියේ අනගැසූ විට මේ සෑම වේදනාවක්ම තවත් වැඩිවුනා.

මෙම අතිශය වේදනාකාරී අත්දැකීම් තුලින් සහ පසුකාලීනව උන්වහන්සේගේ උත්ථානය තුලින් - උන්වහන්සේගේ අපිරිමිත වන්දිගෙවීම තුලින් - අපගේ පසුතැවිලි වීමේ කොන්දේසිය මත, උන්වහන්සේ අමරණීයත්වය ලබා දුන්නා සහ පාපයේ බලපෑම් වලින් සෑම කෙනෙකුටම නිදහස ලබා දුන්නා.

ගැලවුම්කරුවාණන්ගේ වන්දිගෙවීමෙන් පසු සහ උන්වහන්සේගේ අපොස්තුලුවරුන්ගේ මරණින් පසු, ලෝකය අවුරුදු ගණනාවක අඳුරු කාලයකට මුහුණ දුන්නා. පසුව 1820 වන අවුරුද්දේදී, දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ පුත්‍ර, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, ස්වාමින්වහන්සේගේ සභාව නැවත පිහිටුවීම සඳහා දිවැසිවර ජෝසෆ් ස්මිත් හට දර්ශනය වුනා.

උන්වහන්සේ මේ සෑම දෙයක්ම විඳදරාගත් පසු - සහ උන්වහන්සේ මනුෂ්‍යා වර්ගයා වෙනුවෙන් මේ සෑම දෙයක්ම කල පසු, ගැඹුරු පසුතැවීමක් සමඟ මට තේරුම් ගියා ස්වාමින්වහන්සේගේ නැවත පිහිටුවන ලද සභාව අනෙකුත් නම් වලින් අමතන්න නොදැනුවත්වම අවසර දී ඇති බවත්, ඒ සෑම එකකින්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පරිශුද්ධ නාමය ඉවත් කර ඇති බවත්.

සෑම ඉරිදාවකම අපි සුදුස්සන් ලෙස සක්‍රමේන්තුවට සහභාගී වන විට, අපි ස්වර්ගයේ පියාණන්වහන්සේට වූ උතුම් පොරොන්දුව වන උන්වහන්සේගේ පුත්‍රයාණන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය අප තුලට ගැනීමට කැමති බව අප අලුත් කරනවා.[8] උන්වහන්සේව අනුගමනය කිරීමට, පසුතැවිලි වීමට, උන්වහන්සේගේ අණපනත් වලට කීකරු වීමට, සහ සැමවිටම උන්වහන්සේව මතක තබා ගැනීමට අප පොරොන්දු වනවා.

අපි උන්වහන්සේගේ නාමය උන්වහන්සේගේ සභාව තුලින් ඉවත් කල විට, අපි නොදැනුවත්වම උන්වහන්සේව අපේ ජීවිත වල කේන්ද්‍රීය අවධානයෙන් ඉවත් කරනවාද?

ස්වාමින්වහන්සේගේ නාමය අපතුලට ගැනීමේදී- යේසුස් නම් ක්‍රිස්තුස්වහන්සේ බව - අප ක්‍රියාවන්ගෙන් සහ වචන වලින් - ප්‍රකාශ කිරීම සහ සාක්ෂි දැරීමද ඇතුලත් වෙනවා. අපට "මොර්මන්වරු" කියා ආමන්ත්‍රණය කරන කෙනෙකුගේ සිත රිදවීමට අපි භය වීමෙන්, උන්වහන්සේගේ සභාව අමතන නමින් පවා උන්වහන්සේ වෙනුවෙන් නැගී සිට අප ගැලවුම්කාරයාණන්වහන්සේව ආරක්ෂා කිරීමට අපි අසමත් වුනාද?

අපිට මනුෂ්‍යයන් ලෙස සහ පුද්ගලයන් ලෙස අපව පිරිසිදු කර සුවපත් කිරීමට, අපව ශක්තිමත් කර වර්ධනය කිරීමටත්, සහ අවසානයේදී උත්කර්ෂය ලබා ගැනීමටත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීමේ බලයට අවතීර්ණ වීමට නම් - එම බලයට හේතුව උන්වහන්සේ බව අපි පැහැදිලිවම පිළිගැනීමට අවශ්‍යයි. උන්වහන්සේගේ සභාව උන්වහන්සේ නියම කල නාමයෙන් ආමන්ත්‍රණය කිරීමෙන් අපිට ආරම්භ කරන්න පුළුවන්.

ලෝකය පුරා, වර්තමානයේ ස්වාමින්වහන්සේගේ සභාව වෙස්වලාගෙන සිටින්නේ "මෝර්මන් සභාව නමින්." නමුත් අපි ස්වාමින්වහන්සේගේ සභාවේ සාමාජිකයන් හැටියට දන්නවා එහි හිස ලෙස නැගී සිටින්නේ කවුද කියලා: යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔහු විසින්ම. අවාසනාවකට, මෝර්මන් කියන නම අසන බොහෝ දෙනෙක් සිතන්නේ අපි අදහන්නේ මොර්මන්ව කියලයි. එසේ නැත! අපි ඒ උතුම් පුරන ඇමරිකානු දිවසිවරයාට බොහෝ ගරුකරනවා.[9] නමුත් අපි මොර්මන්ගේ අනුගාමිකයන් නොවේ. අපි ස්වාමින්වහන්සේගේ අනුගාමිකයන්.

නැවත පිහිටවූ සභාවේ මුල් කාලයේදී, මෝර්මන් සභාව සහ මෝර්මන්වරු වශයෙන් නම් වර්ග[10] බොහෝ විට අනුවර්ත නාමයන් ලෙස - සැඩපරුෂ නාමයන් ලෙස, අපවාදාත්මක නාමයන් ලෙස භාවිතා කළා - මේවා නිර්මාණය කර තිබුනේ මෙම පසු-දවස්වලදී යේසුස් වහන්සේගේ සභාව නැවත පිහිටුවීමේදී දෙවියන්වහන්සේගේ හස්තය එයින් මකා දමන පිණිසයි.[11]

සහෝදර සහෝදරියනි, සභාවේ නිවැරදි නාමය නැවත පිහිටුවීමට විරුද්ධව බොහෝ ලෞකික වාද තිබෙනවා. අප ජීවත්වන සංඛ්‍යාංක ලෝකයේ හේතුවෙන්, සහ එසැනින්ම ඕනෑම තොරතුරක් සොයාගැනීමට ඇති හැකියාව හේතුවෙන් - ස්වාමින්වහන්සේගේ සභාවේ තොරතුරුද ඇතුලත්ව - විචාරකයන් පවසනවා මේ වෙලාවේ නිවැරදි කිරීමක් කිරීම නුවනට හුරුනැති බව. අනිත් අය හිතනවා අපිව බොහෝ අය දන්නේ "මොර්මන්ගේ සභාව" සහ "මොර්මන්වරු" ලෙස නිසා එයින් උපරිම ප්‍රයෝජන ගැනීමට අවශ්‍යයි කියලා.

මෙය මිනිසා-නිර්මාණය කල සංවිධානයක් පිළිබඳ සාකච්ඡාවක් නම්, සමහරවිට එම තර්කයන් දිනයි. නමුත් මෙම තීරණාත්මක කාරණයේදී, අපි බලන්නේ මෙම සභාවේ අයිතිකරු දෙසයි ඒ වගේම ස්වාමින්වහන්සේගේ ක්‍රම කිසි දවසක මනුෂ්‍යාගේ ක්‍රම නොවන බවට පිළිගන්නවා. අපි ඉවසිලිවන්ත වී අපගේ කොටස හරියාකාරව කල විට, මෙම වැදගත් කාර්යය තුලින් ස්වාමින්වහන්සේ අපට මඟපෙන්වයි . ඒ එසේ වුවත්, හරියට මුහුද තරණය කිරීමට නැවක් සෑදීමට උන්වහන්සේ නෙපිට උදවු කළාක් මෙන්, උන්වහන්සේගේ කැමැත්ත කිරීමට වෙහෙසෙන සියල්ලන්ටම ස්වාමින්වහන්සේ උදවු කරන බව අපි දන්නවා.[12]

මෙම දෝෂ නිවැරදි කිරීමේ අපේ උත්සාහයන් වලදී ආචාරශීලී සහ ඉවසිලිවන්ත වෙන්න අවශ්‍යයි. අපගේ ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීමේදී වගකිවයුතු මාධ්‍යන් ඒ පිළිබඳව දයාව දක්වාවී.

කලින් පැවති ප්‍රධාන සම්මන්ත්‍රණයකදී, වැඩිහිටි බෙන්ජමින් ඩ හොයෝස් එවැනි සිද්ධියක් සම්බන්ධයෙන් කතා කළා. ඔහු පැවසුවා:

“ අවුරුදු කිහිපයකට කලින් මෙක්සිකෝවේ සභාවේ මහජන කටයුතු කාර්යාලයේ සේවය කරන විට, [මගේ සහකරුවෙකු සහ මට] ආරාධනා කළා ගුවන්විදුලි වැඩසටහනකට. ... [එක් වැඩසටහන් අධ්‍යක්ෂකවරයෙකු] ඇසුවා [අපෙන්], ‘ඇයි සභාවට මෙතරම් දිග නමක් තිබෙන්නේ?’ කියා...

“මගේ සහකරු සහ මම එවැනි විශිෂ්ට ප්‍රශ්නයක් දෙස සිනහ වී පසුව තේරුම්කර දුන්නා, සභාවේ නාමය තෝරාගෙන තිබෙන්නේ මනුෂ්‍යයන් විසින් නොවේ. එය ලබා දී තිබෙන්නේ ගැලවුම්කාරයාණන් විසින්. ... වැඩසටහන් අධ්‍යක්ෂක එසැනින්ම සහ ගෞරවාන්විතව පිළිතුරු දුන්නා, ‘අපිත් එයම සතුටින් යුතුව කරමු.’”[13]

එම වාර්ථාව රටාවක් සපයයි. අවුරුදු ගණනාවක සිටම ඇතුල් වී ඇති දෝෂ නිවැරදි කිරීමට පුද්ගලයන් වශයෙන් එකින් එක උපරිම උත්සාහයන් අවශ්‍යයි.[14] අපව නිවැරදි නාමයෙන් හැඳින්වීම සඳහා කරනු ලබන මහපෙන්වීම් ලෝකයා සමහර විට අනුගමනය කරයි නැතිනම් නොකරයි. නමුත් ලෝකයේ බොහෝ දෙනා සභාව සහ එහි සාමාජිකයන්ව අමතන්නේ වැරදි නම් වලින් නම්, ඒ පිළිබඳව කලකිරී අපිත් එයම කරනවානම්, එයට අපට අවසරයක් නැත.

අපගේ සංශෝධිත ශෛල්‍ය මාර්ගෝපදේශකය උපකාරී වෙනවා. එහි තිබෙනවා: “පළමුවන නිර්දේශයේ, සභාවේ සම්පූර්ණ නාමයට වඩා කැමතියි: ‘යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව.’ කෙටිකාල [දෙවන] නිර්දේශයක් අවශ්‍ය නම්, “සභාව” නැතිනම් “යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව” යන නම් භාවිතා කිරීමට දිරිමත් කරනවා. ‘යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පිහිටවූ සභාව’ යන නාමයත් නිවැරදියි.”[15]

කෙනෙකු ඇසුවොත්, “ඔබ මොර්මන්වරයෙක්ද?” කියා, ඔබට පිළිතුරු දෙන්න පුළුවන්, “ඔබ අසන්නේ මම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ සාමාජිකයෙක්ද කියලද, ඔව් මම සාමාජිකයෙක්!” යනුවෙන්.

කෙනෙකු ඇසුවොත්, “ඔබ පසුදවස්වල සාන්තුවරයෙක්ද කියල?”[16] ඔව් එහෙමයි “ඔව්, මම යේසුස් ක්‍රිස්තුස්වාහන්සේව විශ්වාස කරනවා සහ මම උන්වහන්සේගේ නැවත පිහිටවූ සභාවේ සාමාජිකයෙක්” ලෙස ඔබට පිළිතුරු දෙන්න පුළුවන්,

මගේ ආදර සහෝදර සහෝදරියනි, මම පොරොන්දු වෙනවා ස්වාමීන්වහන්සේගේ සභාවේ නිවැරදි නාමය නැවත පිහිටුවීමට අපි අපේ පුළුවන් උපරිමය කලොත්, මෙම සභාවේ අයිතිකරු වන උන්වහන්සේ අපි කවදාවත් දැක නැති ආකාරයට උන්වහන්සේගේ බලය සහ ආශිර්වාද පසු-දවස්වල ශුද්ධවන්තයන්ට[17] ලබා දෙන බව. නැවත පිහිටවූ සුභාරංචියේ ආශිර්වාද සෑම රටකටම, ජාතියකටම, භාෂාවකටම, සහ මනුශ්‍යකුටම ගෙන ගොස් දෙවන පැමිණීම සඳහා ලෝකය සුදානම් කිරීමට අපට අවශ්‍ය දැනුම සහ දෙවියන්වහන්සේගේ බලය ලබාදෙයි.

ඉතින්, නමක් ඇත්තේ කුමක්ද? එය ස්වාමීන්වහන්සේගේ සභාවේ නාමය පිළිබඳව නම්, පිළිතුර වන්නේ “සෑමදේම!” යි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සභාව උන්වහන්සේගේ නාමයෙන් අමතන ලෙස අපිට මඟපෙන්වන්නේ එය උන්වහන්සේගේ බලයෙන් පිරි උන්වහන්සේගේ සභාව නිසයි.

මම දන්නවා දෙවියන්වහන්සේ ජීවමානයි කියලා. යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේයි. උන්වහන්සේ අද උන්වහන්සේගේ සභාවට මඟපෙන්වනවා. මම මෙසේ සාක්ෂි දරන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උතුම්වූ නාමයෙන්, ආමෙන්.

සටහන්

1. “උන්වහන්සේගේ සභාවට එලිදරවූ කල නාමය වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව යන නමේ වැදගත්කම ස්වාමීන්වහන්සේ මගේ මනසට දැනෙන්න සැලැස්වූවා. උන්වහන්සේගේ කැමැත්තට එකඟව කිරීමට අප ඉදිරියේ වැඩ කොටසක් තිබෙනවා. මෑත සති වලදී, විවිධ සභා නායකයන් සහ දෙපාර්තමේන්තු එසේ කිරීමට අවශ්‍ය පියවරයන් ආරම්භ කර තිබෙනවා. මෙම වැදගත් කාරණය පිළිබඳව අමතර තොරතුරු ඉදිරි මාස වලදී ලබා දීමට නියමිතයි.” (Russell M. Nelson, “The Name of the Church” [official statement, Aug. 16, 2018], mormonnewsroom.org).

2. සභාවේ මුලසුන දරන සභාපතිවරුන් ඒ හා සමාන ඉල්ලීම් කර තිබෙනවා. උදාහරණයක් ලෙස, සභාපති ජෝර්ජ් ඇල්බර්ට් ස්මිත් පවසනවා: “මෙම සභාව මොර්මන්ගේ සභාව ලෙස අමතා ස්වාමීන්වහන්සේව දූකට පත්කරන්න එපා. උන්වහන්සේ එය මොර්මන්ගේ සභාව ලෙස නම් කලේ නෑ. (in Conference Report, Apr. 1948, 160).

3. See “Style Guide—The Name of the Church,” mormonnewsroom.org.

4. දහම සහ ගිවිසුම 115:4.

5. 3 නෙපි 27:7–8.

6. බලන්න මෝසෙස් 1:33.

7. බලන්න දහම සහ ගිවිසුම 19:18.

8. බලන්න මොරෝනි 4:3; දහම සහ ගිවිසුම 20:37, 77.

9. මෝර්මන් යනු අපගේ මෝර්මන් පොතේ සිටි එක ප්‍රධාන කතෘවරයෙක්, අනික් අය නෙපි, යාකොබ්, සහ මොරෝනියි. සියලුදෙනාම ස්වාමීන්වහන්සේව ඇසින් දුටු සාක්ෂිකරුවන්, ඒ වගේම එහි දේවානුභාවයෙන් යුත් පරිවර්තකයා, දිවැසිවර ජෝසෆ් ස්මිත්.

10. මොර්මනයිට්ස් යන වචනය පවා අපහාසයක් ලෙස අන්වර්ත නාමයක් ලෙස තිබුණි. (see *History of the Church,* 2:62–63, 126).

11. නව ගිවිසුම කාලයේදීත් වෙනත් අන්වර්ථයන් ඇති වූ බව පෙනෙන්ට තිබෙනවා. අපොස්තුලුවර පාවුලුගේ හිරිහැර කාලයේදී පවා, ඔහුට "නසරීයන්ගේ නිකායේ නායකයා" ලෙස හඳුන්වා ඇත (ක්‍රියා 24:5). "නාසරීයේ" යන වචනය සම්බන්ධයෙන් එක් විස්තර කරන්නෙකු ලියා තිබුනා: "අවමානය කිරීමක් වශයෙන් ක්‍රිස්තියානුවන්ට භාවිතා කල නම මෙයයි. ඔවුන්ට එසේ අමතා ඇත්තේ යේසුස්වහන්සේ නාසරෙත් නුවරින් නිසා බව පවසනවා" (Albert Barnes, Notes, Explanatory and Practical, on the Acts of the Apostles [1937], 313).

ඒ හා සමානව, තවත් එක් විස්තර කරන්නෙකු පවසනවා: "අපගේ ස්වාමින්වහන්සේට අවමානාත්මක ලෙස "නසරිනයා" ලෙස හඳුන්වන නිසා (මතෙව් 26:71), ජුදෙවුවරුන් උන්වහන්සේගේ අනුගාමිකයන්ව "නාසරීනයන්" ලෙස අමතනවා. ඔවුන් පිළිගන්නේ නෑ ඔවුන් ක්‍රිස්තියානුවන් බව. උදා: මෙසිස්යස්වහන්සේගේ අනුගාමිකයන් බව." (The Pulpit Commentary: Acts of the Apostles, ed. H. D. M. Spence and Joseph S. Exell [1884], 2:231).

ඒ හා සම්බන්ධ යමක්, වැඩිහිටි නීල් ඒ. මැක්ස්වෙල් නිරීක්ෂණය කර තිබුනා: "ශුද්ධලියවිලි වල ඉතිහාසය මුළුල්ලේම, අපට පෙනෙන්නට තිබෙනවා දිවසිවරුන්ව පහ කිරීමේ අරමුණින් ඔවුන්ට අවමන් කිරීමට නැවත නැවතත් දරන උත්සාහයන් - ඔවුන්ව විනාශකිරීමේ අරමුණින් විවිධ නම් පටබඳිනවා. බොහෝ විට, කෙසේ වෙතත්, ඔවුන්ගේ සමකාලීනයන් සහ ලෞකික ඉතිහාසය ඒවා ලෙහෙසියෙන් නොසලකා හැර තිබෙනවා. ඒ එසේ වුවත්, මුල් කාලීන ක්‍රිස්තියානුවන්ව "නාසරීනයන්ගේ නිකායන්" ලෙස හඳුන්වා තිබෙනවා. (ක්‍රියා 24:5.)" ("Out of Obscurity," *Ensign,* Nov. 1984, 10).

12. 1 නෙපි 18:1–2.

13. Benjamín De Hoyos, "Called to Be Saints," *Liahona,* May 2011, 106.

14. අනිත් මිනිසුන් අප අමතන දේ පිළිබඳව අපට පාලනයක් නැති වුනත්, අපි අපව අමතා විදිහ පිළිබඳව අපට සම්පූර්ණ පාලනය තිබෙනවා. අපි කොහොමද අනිත් අයගෙන් බලාපොරොත්තුවන්නේ සභාවේ නිවැරදි නමට ගරුකරන ලෙස, අපි එසේ නොකරනවානම්.

15. "Style Guide—The Name of the Church," mormonnewsroom.org.

16. සාන්තුවරයින් යන වචනය බයිබලයේ බොහෝ විට භාවිතා කර තිබෙනවා. උදාහරණයක් වශයෙන්, පවුලුගේ සංදේශයේ එපීසවරුන්ට, සාන්තුවරුන් යන වචනය අවම වශයෙන් එක පරිච්ඡේදයකට වරක් හෝ භාවිතා කර තිබෙනවා. සාන්තුවරයෙක් යනු යේසුස් ක්‍රිස්තුස්වහන්සේව විශ්වාසකරන සහ උන්වහන්සේව අනුගමනය කරන පුද්ගලයෙක්.

17. දහම සහ ගිවිසුම 121:33 බලන්න.

© 2018 by Intellectual Reserve, Inc. All rights reserved. Printed in USA. English approval: 6/17. Translation approval: 6/17.
පරිවර්තනයකි *First Presidency Message, November 2018.* Sinhala. 15054 408